**මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය - 2023**

**-----------------------------------------------**

මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වියදම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අන්තර්ජාතික සංවර්ධන සංගමය අතර 2017 ඔක්තෝබර් 04 දින එළඹි අංක 6006 දරණ මූල්‍යකරණ ගිවිසුමේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

මූල්‍යකරණ ගිවිසුමට අනුව මුදල් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් සහ පුද්ගලයන් සඳහා මූල්‍ය වෙළෙඳපොළ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ මූල්‍ය සේවා භාවිතය ඉහළ නැංවීමට දායක වීමයි. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ප්‍රතිඵල මත පදනම් වූ මූල්‍යකරණය, ආයෝජන මත පදනම් වූ මූල්‍යකරණය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය සහ ඉදිරිපස ගාස්තුව යන කොටස් 03ක් යටතේ ක්‍රියාත්මක වේ. මූල්‍යකරණ ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 22,500 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 75 ක් වූ අතර මෙම මුදල මූල්‍යකරණය කිරීමට අන්තර්ජාතික සංවර්ධන සංගමය එකඟ විය. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2018 ඔක්තොම්බර් 18 වන දින ආරම්භ කරන ලද අතර ව්‍යාපෘති කටයුතු 2022 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2023 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබූ අතර ව්‍යාපෘතියේ කටයුතු 2023 දෙසැම්බර් 29 දින අවසන් කරන ලදී.

## 1.3 මතය

2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රගතිය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| | පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ. | | |
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ කටයුතු සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් වෙන් කරන ලද මුළු ප්‍රතිපාදනය වූ රු.මිලියන 339 න්, සියයට 22% ක් නියෝජනය වන රු. මිලියන 73 ක මුදලක් ව්‍යාපෘතිය මගින් උපයෝජනය කර නොතිබුණි. | නිරීක්ෂණය සම්බන්ධයෙන් එකඟ වෙමි. | වෙන් කර ඇති මුළු අරමුදල් අපේක්ෂිත පරිදි භාවිතා කිරීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ii) | ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත මුදල එ.ජ.ඩො. මිලියන 75 කි. ව්‍යාපෘතිය ආරම්භයේ සිට වසර හයක් ඉකුත්ව යෑමෙන් පසුව අවසන් කර තිබුණද, සමස්ත ණය ප්‍රයෝජනය එ.ජ.ඩො. මිලියන 8.95 ක් වූ අතර එය ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැයෙන් 11.94% ක් විය. | නිරීක්ෂණය සම්බන්ධයෙන් එකඟ වෙමි. | -එම- |
| (iii) | උපයෝජනය නොකළ ණය සඳහා 0.25%ක බැඳීමේ ගාස්තු ගෙවීමට ව්‍යාපෘතිය බැඳී සිටියි. ඒ අනුව, 2018 සිට 2023 දක්වා රු.221,135,313 (එ.ජ.ඩො. 992,133) ක ආර්ථික නොවන බැඳීම් ගාස්තු මූල්‍යකරණ නියෝජිතායතනයට ගෙවා තිබුණි. | බැඳීම් ගාස්තු විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් හසුරුවන බැවින් කිසිදු අදහස් දැක්වීමක් සිදු කළ නොහැකිය. | -එම- |
| (iv) | 2023 වර්ෂයේදී ව්‍යාපෘතිය මගින් කිසිදු ක්‍රියාකාරකමක් සිදු කර නොතිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය පහත දැක්වේ. | නිරීක්ෂණය සම්බන්ධයෙන් එකඟ වෙමි. | අපේක්ෂිත පරිදි ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | ක්‍රියාකාරකම් සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| **සංරචකය 01** | | |
| DLI 1 - මූල්‍ය පද්ධතියේ (CBSL, SEC සහ IRCSL) ඒකාබද්ධ, අවදානම් පාදක අධීක්ෂණය අනුගමනය කිරීම. | ක්‍රියාකාරකම් 3 යි | 6.5% |
| DLI 2 - මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව (FCP) සඳහා ආයතනික සහ නියාමන රාමුවක් ස්ථාපනය කිරීම, ප්‍රතිඵලය සක්‍රීය කිරීම: FCP සඳහා නෛතික සහ නියාමන රාමුව ක්‍රියාත්මක කිරීම සහ සියලුම මූල්‍ය සේවා හරහා FCP සඳහා ආයතනික ධාරිතාව වර්ධනය කිරීම | ක්‍රියාකාරකම් 1 යි | 6.5% |
| DLI 3 - සේවක අර්ථසාධක අරමුදලේ (EPF's) වත්කම් (ආයෝජන) සහ වගකීම් (රැස්කිරීම්) සාකල්‍ය කළමනාකරණය සඳහා තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම සහ විවිධාංගීකරණය වූ ආයෝජන උපාය මාර්ගයක් අනුගමනය කිරීම. | ක්‍රියාකාරකම් 1 යි | 0.00% |
| DLI 4 - මූල්‍ය ස්ථායීතාවයට ඇති විය හැකි අවදානම් අවම කිරීම සඳහා ආයතනික සුරැකුම්පත් සඳහා භාර දීමට එදිරිව ගෙවීම් (DvP) පියවීමේ ක්‍රමය ස්ථාපනය කිරීම. | ක්‍රියාකාරකම් 3 යි | 6.5% |

| | | |
|---|---|---|
| DLI 5 - ප්‍රාරක්‍ෂණ සහ ප්‍රතිරක්‍ෂණ ව්‍යාපාර වෙන්කරමින් ජාතික රක්‍ෂණ භාර අරමුදල (NITF) ප්‍රතිව්‍යුහගත කිරීම. | ක්‍රියාකාරකම් 1 යි | 6.5% |

**සංරචකය 02**

| | | |
|---|---|---|
| (අ) අධීක්ෂණය සහ නියාමනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ධාරිතාව ශක්තිමත් කිරීම සහ අදාළ මූල්‍ය යටිතල පහසුකම් නවීකරණය කිරීම | ක්‍රියාකාරකම් 2 යි | 0.74% |
| (ආ) අධීක්ෂණය සහ නියාමනය සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ධාරිතාව ශක්තිමත් කිරීම සහ අදාළ මූල්‍ය යටිතල පහසුකම් නවීකරණය කිරීම | ක්‍රියාකාරකම් 9 යි. | 1.65% |
| | ක්‍රියාකාරකම් 12 යි. | 0.00% |
| (ඇ) අධීක්ෂණය සහ නියාමනය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ IRCSL හි ධාරිතාව ශක්තිමත් කිරීම සහ අදාළ මූල්‍ය යටිතල පහසුකම් නවීකරණය කිරීම | ක්‍රියාකාරකම් 2 යි. | 1.69% |